සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8712

Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade 08	විෂයය / பாடம் / Subject භූගෝල විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper I ,II	කාලය / காலம் / Time පැය 02යි.

නම:-.. විභාග අංකය:-..

සැලකිය යුතුයි

- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

I පත්‍රය

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ආලෝකය හා තාපය නිකුත් කරන ආකාශ වස්තුවක් වන්නේ කුමක් ද?
 1. ග්‍රහලෝක 2. උපග්‍රහයන් 3. ග්‍රහක 4. සූර්යයා

02. බුධ ග්‍රහයාගේ මතුපිට සාමාන්‍ය උෂ්ණත්වය
 1. 464^0C කි. 2. 167^0C කි. 3. 15^0C කි. 4. -225^0C කි.

03. පෘථිවියේ 78.9ක් ලෙස පවතින වායු වර්ගය කුමක් ද?
 1. කාබන්ඩයොක්සයිඩ් 2. ඔක්සිජන් 3. ආගන් 4. නයිට්‍රජන්

04. පෘථිවිය දේශාංශ පදනම් කරගත් කලාප හෙවත් සම්මත වේලා කලාප ගණන වන්නේ
 1. 12කි. 2. 18කි. 3. 24කි. 4. 48කි.

05. විශ්වය නිරීක්ෂණය සඳහා මුලින්ම දුරදක්නය භාවිතා කරන ලද්දේ
 1. ක්ලෝඩියස් ටොලමි ය. 2. ගැලිලියෝ ගැලිලි ය.
 3. ජොහැන්නස් කෙප්ලර් ය. 4. අයිසෙක් නිව්ටන් ය.

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ප්‍රශ්න ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සූර්යයා තම අක්ෂය වටා භ්‍රමණය වීමට ගතවන කාලය පෘථිවි දින 25.4කි. (......................)

07. ග්‍රහලෝක අතරින් අධිකතම ගුරුත්වාකර්ෂණ බලයක් ඇත්තේ පෘථිවියටයි. (......................)

08. බංග්ලාදේශයේ සුන්දරබාන් වගුරුබිම ආශ්‍රිතව 'ජූට් වගාව' සිදු කරයි. (......................)

09. 1:50000 භූ ලක්ෂණ සිතියම් නිර්මාණයේ දී ශ්‍රී ලංකාව සිතියම් පත්‍ර 92කට බෙදා ඇත. (......................)

10. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් නිර්මාණයේ දී භූමිය මත පිහිටි මිනිසාගේ මැදිහත් වීමෙන් නිර්මාණය කර ඇති ලක්ෂණ භෞතික ලක්ෂණ ලෙස හැඳින්වේ. (......................)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා පහත දක්වා සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක වල විවිධත්වයන් කිහිපයක් 'අ' තීරුවේ දක්වා ඇත. 'ආ' තීරුවේ දැක්වෙන ග්‍රහලෝක සමඟ නිවැරදිව ගලපන්න.

	අ	ආ
11.	නිල් ග්‍රහයා	යුරේනස්
12.	නැගෙනහිර සිට බටහිරට භ්‍රමණය වේ.	අඟහරු
13.	රතු ග්‍රහයා	නෙප්චූන්
14.	සූර්යයාගේ සිට හය වන ස්ථානයේ ඇත.	පෘථිවිය
15.	අධිකම ශීතලකින් යුක්ත ග්‍රහලෝකය	සෙනසුරු
		සිකුරු

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වරහන් තුළ ඇති වචන උපයෝගී කරගෙන සුදුසු පිළිතුර ලියන්න.
(ගල්ඔය, මීගමුව, මහඔය, ග්‍රීෂ්මාන, සරත්, සිසිර, වසන්ත)

16. අක්‍රියව පැවති ශාක නැවත දළු ලා වැඩී මල් හා ඵල හට ගැනීම ආරම්භ වන්නේ .... ඍතුවෙනි.

17. ශාක වල පත්‍ර හැලීම ආරම්භ වන්නේ .... ඍතුවෙනි.

18. මානුෂ කටයුතු බොහෝ සෙයින් .... ඍතුවේදී සීමා වේ.

19. කඩොලාන පරිසර පද්ධතිය බහුල වශයෙන් .... ප්‍රදේශයේ දක්නට ඇත.

20. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය ජල යෝජනා ක්‍රමය .... පිහිටා ඇත.

(ලකුණු 2 × 20 = 40)

II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. (i) පහත රූප සටහනේ A, B, C, D ලෙස නම් කර ඇති අක්ෂාංශ රේඛා හා දේශාංශ රේඛා හඳුන්වන්න.

(i) A ....
(ii) B ....
(iii) C ....
(iv) D ....



(ලකුණු 2 × 4 = 08)

(ii) දේශාංශ 0^0 රේඛාව වැටී ඇති ප්‍රධාන නගරය කුමක් ද? .... (ලකුණු 01)

(iii) කොළඹ නගරය හරහා වැටී ඇති දේශාංශ රේඛාව නම් කරන්න. .... (ලකුණු 01)

(iv) දේශාංශ 180^0 පදනම් කර ගනිමින් ලකුණු කර ඇති රේඛාව කුමක් ද?

.... (ලකුණු 01)

(v) දේශාංශ 0^0 රේඛාව මත වේලාව දහවල් 12.00 නම් නැගෙනහිර දේශාංශ 75^0 වේලාව ගණනය කරන්න. .... (ලකුණු 02)

(vi) පෘථිවිය මත ජීවීන් ඇතිවීමට හේතු වූ සුවිශේෂී ගුණාංග තුනක් ලියන්න.

....

....

.... (ලකුණු 03)

02. (i) තාරකා සහ ග්‍රහලෝකවලට අමතරව අහසේ දැකිය හැකි ග්‍රහ වස්තූන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) තරු හා ග්‍රහලෝක එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ ද? කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) a. අභ්‍යන්තර ග්‍රහලෝකයක් හා බාහිර ග්‍රහලෝකයක් නම් කරන්න. (ලකුණු 02)

b. අභ්‍යන්තර ග්‍රහලෝක හා බාහිර ග්‍රහලෝක යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

03. (i) සිකුරු ග්‍රහලෝකය හඳුන්වන වෙනත් නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) a. අඟහරු ග්‍රහයාගේ උපග්‍රහයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

b. 'උපග්‍රහයින්' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(iii) a. වාමන ග්‍රහලෝක තුනක් නම් කරන්න. (ලකුණු 03)

b. 'වාමන ග්‍රහලෝක' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

04. (i) පහත සඳහන් ප්‍රතිශත ජල ගෝලයේ ජලයේ ව්‍යාප්තිය පවතින ආකාරය ලියන්න.

අ. 97%

ආ. 0.5% (ලකුණු 02)

(ii) වායුගෝලයේ ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) a. පෘථිවියේ ජලය පවතින ආකාර දෙකක් දක්වන්න. (ලකුණු 01)

b. ජලයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

05. (i) දකුණු ආසියාවේ සාපේක්ෂ පිහිටීම අනුව උතුරින් හා බටහිරින් පිහිටි මායිම් දෙක නම් කරන්න.

උතුර -

බටහිර - (ලකුණු 02)

(ii) a. භූගෝලීය වශයෙන් මධ්‍යම ආසියාවේ සාර්ක් සංවිධානයට අයත් රට කුමක්ද? (ලකුණු 01)

b. පහත සඳහන් රටවලට අයත් අගනුවරවල් සඳහන් කරන්න.

1. භූතානය -

2. නේපාලය -

3. පාකිස්ථානය - (ලකුණු 03)

(iii) 'දකුණු ආසියානු කලාපය භූ දර්ශනය අනුව බෙදා වෙන්කර ඇත.'

a. පාකිස්ථානයේ පිහිටි කඳු වැටි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

b. හිමාලයා කඳුවැටි ප්‍රදේශය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

06. (i) දකුණු ආසියානු කලාපයේ මුහුදු වෙරළකට හිමිකම් නොමැති රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) a. වෙරළබඩ භූ ලක්ෂණය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති මානුෂ ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

b ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) a. 'නාගරික භූ දර්ශනය ආශ්‍රිත ගැටලු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

b. එම ගැටලු අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

07. (i) 1:50000 සිතියම්වල භූමිය මත දක්නට ලැබෙන ස්වාභාවික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) a. ශ්‍රී ලංකාවේ' පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුවට ඇති දුර හා කොළඹ සිට සංගමන්කන්ද තුඩුවට ඇති දුර කොපමණ ද? (ලකුණු 02)

b. සමෝච්ච රේඛා යනු මොනවා ද? (ලකුණු 02)

(iii)



a. ඉහත රූප සටහනේ සමෝච්ච රේඛා අන්තරය පදනම් කරගෙන සමෝච්ච රේඛා අඳින්න. (ලකුණු 02)

b. කොත් කන්ද යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. දළ රූපසටහනකින් පෙන්වන්න. (ලකුණු 03)